| සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක: 37/2026 |
|---|

මගේ අංකය :- PPSC/ES/04/FI/6/3/5
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
පළාත් සභා කාර්යාල සංකීර්ණය
නව නගරය, රත්නපුර.
2026.09. 21

*සබරගමුව පළාත් සභාවේ,*

01. ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්
02. පළාත් පාලන කොමසාරිස්
03. පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026(II)**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් ඉහත විභාගය සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛය සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් සබරගමුව පළාත් සභා නිල වෙබ් අඩවියේ (www.sg.gov.lk) හා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ (www.psc.sg.gov.lk) පළ කර ඇත.

03. මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් යුක්ත වන අතර විභාගයේ විෂයය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| විෂයය අංකය | විෂයය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| 01 | <u>සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය ක්‍රම</u><br>• ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මූලික දැනුම.<br>• ආයතන සංග්‍රහයේ VI සිට VIII දක්වා ද, XII, XIV, XXIV, XXVII, XXVIII පරිච්ඡේද ඇතුළත් වේ.<br>• මුදල් රෙගුලාසි - පුස්තකාල මගින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාළ රෙගුලාසි.<br>• 1973 අංක 48 දරන රාජ්‍ය ලේඛනාරක්ෂක පනත හා 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක(සංශෝධන) පනත<br>• 1994 අංක 11 දරන විද්‍යා හා තොරතුරු තාක්ෂණ සංවර්ධන පනතේ iii කොටස<br>• 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත<br>• 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත | පැය 03 | 100 |
| 02 | <u>පුස්තකාල සංවිධානය</u><br>• පුස්තකාල ගොඩනැගිලි හා උපකරණ<br>• රජයේ ප්‍රකාශනවල ප්‍රයෝජන හා භාවිතා කරන අයුරු<br>• පුස්තකාල ක්ෂේත්‍රයේ කලාපීය හා අන්තර්ජාතික සංවිධානය<br>• පුස්තකාල කළමනාකරණයේ ක්‍රමෝපායන්<br>• මූල්‍ය කළමනාකරණය<br>• කාල කළමනාකරණය<br>• මානව සම්පත් කළමනාකරණය<br>• ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කටයුතු<br>• පුස්තකාල පරිගණකකරණය පද්ධති හා ජාල | පැය 03 | 100 |

සටහන :- මෙම විභාගයෙන් සමත්වීමට එක් එක් විෂයය සඳහා වූ ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40 %) බැගින් ලබා ගත යුතුවේ.

04. **විභාගයට අයදුම් කිරීම :-** මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතිය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතිය ප්‍රකාරව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, නිවැරදිව හා පැහැදිළිව පිළියෙල කළ අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2026 ඔක්තෝබර් මස 20 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **" ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම හා ශ්‍රේණිය සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය:-** අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. වලංගු ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

06. **විභාග ගාස්තු :-** පළමුවරට මෙම විභාගය සඳහා පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එහෙත් ඉන්පසු වාරවලදී විභාගය සඳහා පෙනී සිටින නිලධාරීන්ගෙන් සමස්ත විභාගය සඳහා රු.600/- ක් ද, එක් විෂයයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු.250/- ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. **එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය.** කුමන කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. විභාගයට පෙනී සිටීම සඳහා පිළිගන්නා අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය, විභාගය පැවැත්වීමට දින 14කට පෙර අයදුම්පතෙහි සඳහන් ලිපිනයට නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

08. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

පිටපත :-

ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත - කාරුණික දැනගැනීම සඳහා

*ආදර්ශ අයදුම් පත්‍රය*

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026(II)**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(කොටුව තුළ අදාළ අංකය ලියන්න )

1.0 1.1 මුල්'කුරු සමඟ නම : ..........................................................
(සිංහලෙන් / දෙමළෙන්) ..........................................................

1.2 මුල්'කුරුවලින් හැඳින්වෙන නම් : ..........................................................
(සිංහලෙන් / දෙමළෙන්) ..........................................................

1.3 මුල්'කුරු අගට යොදා මුලකුරු සමඟ නම..........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA, A.B.

2.0 2.1 සේවය කරන කාර්යාලයේ /දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම :..........................................................
..........................................................

2.2 රාජකාරි ලිපිනය: ..........................................................
..........................................................
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

3.0 ස්ත්‍රී / පුරුෂ භාවය : ..........................................................

4.0 4.1 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

4.2 දුරකථන අංකය : රාජකාරි ..........................................................

පෞද්ගලික ..........................................................

5.0 ඔබ පෙනී සිටින විභාගයේ විෂයයන් හා විෂයය අංකය :

| විෂයය | විෂයය අංකය |
|---|---|
| | |
| | |

6.0 දැනට දරන තනතුර :

6.1 සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති තනතුරට පත් වූ දිනය : ........................................................................

6.2 එම තනතුරේ II ශ්‍රේණියට උසස්වීම් ලැබූ දිනය හා උසස්වීම් ලිපියේ අංකය :

........................................................................................................................

7.0 7.1 ඔබ විභාගයට ඉල්ලුම් කරන්නේ ප්‍රථම වතාවටද ?...................................................

7.2 එසේ නොවන්නේ නම්, විභාග ගාස්තු ගෙවා ලබාගත් (අමුණා ඇති) මුදල් භාරගැනීමේ කුවිතාන්සියේ,

අංකය................................ මුදල ................................

දිනය................................ විභාග ගාස්තු ගෙවූ................................................ කාර්යාලය ..........................................................

| |
|---|
| මුදල් භාරගැනීමේ කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න<br>*(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)* |

8.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දන්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට ද එකඟ වෙමි.

....................................... ...............................................

දිනය අයදුම්කරුගේ අත්සන

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

(අ) මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ නියුතු සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති සේවයේ II වැනි ශ්‍රේණියේ නිලධාරියකු / නිලධාරිනියක බව ද,

(ආ) ඉහත සපයා ඇති විස්තර නිවැරදි බව ද,

(ඇ) ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සෑම විටම සතුටුදායක බවද, පසුගිය පස් අවුරුදු කාලසීමාව තුළ (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනය දඬුවමකට භාජනය නොවූ බව ද,

( ඈ) ඔහු /ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද,

(ඉ) නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවද, එම කුවිතාන්සිය අලවා ඇති බව ද ( අදාළ නොවේ නම් කපා හරින්න) මම සහතික කරමි.

.................................................... .......................................................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව